# Asia Floor Wage Alliance – Sri Lanka

**කම්කරු අයිතිවාසිකම් අනතුරේ : 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් ඇඟලුම් කම්කරුවන් අනතුරට සහ දැඩි අනාරක්ෂිතභාවයකට තල්ලු කරමින් සිටින අවස්ථාවක AFWA ,ශ්‍රී ලංකාව සමඟ එක්ව සිටී.**

'දිට්වා' සුළි කුණාටුවේ විනාශයෙන් පීඩා විඳින ශ්‍රී ලංකාවේ ඇඟලුම් සේවකයින් සමඟ ආසියානු පොදු වැටුප් ව්‍යාපාරය (Asia Floor Wage Alliance - AFWA) නැගී සිටියි. "මෙම සුළි කුණාටුව ඇති වීමට බොහෝ කලකට පෙර සිටම ඇඟලුම් සේවකයින් දරිද්‍රතා මට්ටමේ වැටුප් මත යැපෙමින්, වැටුප් සොරකම් මධ්‍යයේ, දුෂ්කර සේවා පැය ගණන් සහ අමානුෂික නිෂ්පාදන ඉලක්ක සමඟ කටයුතු කරමින් තම ජීවිතය ගැට ගසා ගැනීමට අරගල කරමින් සිටියහ. සුළි සුළං වැනි දේශගුණික විපත් හේතුවෙන් ආන්තිකරණයට ලක්ව ජීවත් වන මෙම කම්කරුවන් දැඩි මානුෂීය අර්බුදයකට තල්ලු වේ," යැයි ආසියානු පොදු වැටුප් ව්‍යාපාරයේ දකුණු ආසියානු සම්බන්ධීකාරක අභිරාම් සිවලෝගනාදන් පැවසීය.

සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ගංවතුර සහ නායයෑම් තත්වය මගින් ශ්‍රී ලංකාවේ පුද්ගලයින් 350 කට අධික සංඛ්‍යාවක් (තවමත් ගණනය වෙමින් පවතී) ජීවිත බිලිගෙන ඇත. කම්කරු ජනාවාස පවා ජලයෙන් යටවී ඇත. නිවාස ඉතා වේගයෙන් ජලයෙන් යට වූ බැවින්, සහන කඳවුරුවලට ගෙන යාමට පෙර තම බඩු බාහිරාදිය එකතු කර ගැනීමට පවා ජනතාව හට වෙලාවක් නොතිබුණි. වීදි, ප්‍රවේශ මාර්ග සහ අවට ප්‍රදේශ එක රැයකින් ජලයෙන් යටවීම නිසා කම්කරුවන් හට ආහාර, පිරිසිදු ජලය, ප්‍රවාහනය, විදුලිය සහ සන්නිවේදන පහසුකම් අහිමි විය.

ගංවතුර, කම්කරුවන්ගේ නේවාසික ප්‍රදේශවලට භයානක වේගයකින් පැතිර ගොස් ඇත. කාර්මික කලාපයන්හි කර්මාන්තශාලා අසල සමහර අසල්වැසි ප්‍රදේශවල, පිටාර ගලන ඇළ මාර්ගවලින් අපජලය ඍජුවම කම්කරුවන්ගේ නිවාසවලට කාන්දු වී ඇත. මේ වන විට ජල පද්ධති අවදානමට ලක්ව ඇති අතර, මේ හේතුවෙන් සේවකයින් හට සනීපාරක්ෂක පහසුකම් හෝ පිරිසිදු ජලය සඳහා විශ්වාසදායක ප්‍රවේශයක් නොමැත. කර්මාන්තශාලා කිහිපයක් මුළුමනින් පාහේ හෝ සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වී ඇති අතර, අවට වීදි සහ මාර්ග ගමන් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇත. මේ හේතුවෙන් කම්කරුවන් එම ප්‍රදේශ තුළ සිර වී ඇත

පවතින තත්වය අවදානම් අතට හැරෙන විට, බොහෝ විට දැනුම්දීමකින් තොරව සහ ඔවුන්ට රැගෙන යා හැකි දේ පමණක් සහිතව, ජනතාව තාවකාලිකව ආරක්ෂිත ස්ථාන කරා ගෙන යනු ලැබේ. ගංවතුර මට්ටම මගින් ඔවුන්ට පිටවීමට ඇති මාර්ග අවහිර වී ඇති බැවින් පිටව යාමට නොහැකිව තවත් සමහරු තවමත් අතරමංව සිටිති. රතු අනතුරු නිවේදන නිකුත් කර තිබියදීත්, සමහර සැපයුම්කරුවන් තවමත් ඇඟලුම් සේවකයින් හට රාජකාරියට වාර්තා කරන ලෙස නියෝග කර ඇති අතර අනෙක් ඒවා හදිසියේම වසා දමා ඇත.

අර්බුදකාරී අවස්ථාවන්හිදී, කම්කරු පන්තිය - විශේෂයෙන් ඇඟලුම් කම්කරුවන්, සංක්‍රමණික සේවකයින් සහ කාර්මික කලාපවල ජීවත් වන අය - වඩාත්ම පීඩාවට පත්වේ. බොහෝ දෙනෙකුට නිවාස යන්නෙන් අදහස් වුයේ ජනාකීර්ණ හා දුර්වල සේවාවන් සහිත ප්‍රදේශ - මේ වන විට ඔවුන්ට ඒවා නායයෑම් සහ ගංවතුර හේතුවෙන් අහිමි වී ඇත. නිවාස විනාශ වීම, ගමන් බිමන් යා නොහැකි වීම සහ කර්මාන්තශාලා ජලයෙන් යටවීම හේතුවෙන්, බොහෝ දෙනෙකුට නිවාස සහ ආරක්ෂාව පමණක් නොව ආහාර, ඖෂධ

සහ පාසල් ගාස්තු වැනි දේ සපුරා ගැනීම සඳහා භාවිතා කරනු ලබන තම වැටුප් ද අහිමි වීමේ භයානක තත්වයකට දැන් මුහුණ දීමට සිදුවේ.

සහන කටයුතු සම්බන්ධීකරණය කරන ශ්‍රී ලංකාවේ අපගේ හවුල්කරුවන් සමඟ AFWA මේ මොහොතෙ නැගී සිටී. අවතැන් වූ කම්කරුවන්ට සහ ඔවුන්ගේ පවුල් හට සහයෝගය දැක්වීම සහ පීඩාවට පත් වූවන් අතහැර නොදැමීම සහතික කිරීම සහ ඇඟලුම් කම්කරුවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනඟා ගැනීම සඳහා මේ මොහොතේ අවශ්‍ය සම්පත් ලබා ගැනීම සඳහා දක්වන වෙහෙස මහන්සිය සහ ඔවුන්ගේ කැපවීම නොසැලෙන සුළුය.

ඔබගේ දායකත්වය, අපගේ හවුල්කාර සංවිධානයන්හි උත්සාහයන් සෘජුවම ශක්තිමත් කරනු ඇත. අනතුරුදායක තත්ත්වයන්, කර්මාන්තශාලා වැසීම සහ නැවත නිවෙස් බලා යාමේ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා ආහාර, ජලය සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සහතික කිරීමට ආධාර සහ පරිත්‍යාග උපකාරී වේ. ශ්‍රී ලංකාවේ ඇඟලුම් සේවකයින්ගේ අනාගතය අවිනිශ්චිතයි. ඔවුන්ට ද්‍රව්‍යමය වූ, අප්‍රමාද සහ තිරසාර වූ සහයෝගය අවශ්‍යයි.

**බලපෑමට ලක් වූ සේවකයින් සහ පවුල් සඳහා හදිසි සහන සේවා සැපයීමට සහයෝගය දැක්වීම සඳහා අදම පරිත්‍යාග කරන්න**